// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2135/41 - 2019 අගෝස්තු මස 06 වැනි අඟහරුවාදා - 2019.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

## මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ ආණ්ඩුකාර මෛත්‍රී ගුණරත්න වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 (1) (අ) වගන්තිය සමග කියවිය යුතු 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193 (උඋ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද නගර සභාවල සභිකයන් සඳහා ඉන්ධන දීමනාවක් ගෙවීමට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2019.03.15 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**මෛත්‍රී ගුණරත්න,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාර,
මධ්‍යම පළාත.

2019 මාර්තු මස 15 වැනි දින.
මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

### රීති

01. මෙම රීති නගර සභාවේ සභිකයන් සඳහා ඉන්ධන දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

02. මෙම දීමනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1914/40 හා 2015.05.15 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත දීමනාවලට අමතර වශයෙනි. නගර සභා සභිකයන්ට පහත සඳහන් පරිදි ඉන්ධන දීමනාවක් ඒ ඒ නගර සභා අරමුදලින් ගෙවිය හැකි වේ.

මධ්‍යම පළාතේ නගර සභා සභිකයන් වෙත මසකට රු. 2,500.00ක ඉන්ධන දීමනාවක් ගෙවීම.

* මෙම දීමනාව අදාළ වන්නේ නගර සභා සභිකයන් සඳහා පමණි.

* නගර සභාවල සභාපති/උප සභාපති දැනට ඉන්ධන දීමනාවක් නොලබන්නේ නම් මෙම දීමනාව ලබාගත හැකිය. එකම කරුණක් සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකුට දීමනා දෙකක් ලබා ගැනීමට හිමිකමක් නැත.

* මහා නගර සභාවලට මෙය අදාළ නොවේ.

* සෑම සභිකයෙකුටම උපරිමය රු. 2,500කි. තමාට යතුරු පැදියක්/ත්‍රීවිලරයක්/වෙනත් මෝටර් රථයක් නොමැති නම් වෙනත් වාහනයක් භාවිතා කළ හැකි අතර, බිල්පත් හෝ ලිපි ඉදිරිපත් කළ යුතු වේ. ඊට අදාළ ධාවන සටහන් ලබාගත යුතු වේ.

* සභාවේ රාජකාරි හෝ සංවර්ධන කටයුතු අධීක්ෂණය සඳහා ධාවනය කරන ලද විස්තර ඉදිරිපත් කළ යුතුය.

08 - 800